

පැළය වටා කවාකාරව සකස් කර ගන්නා ලද කාණුවට කුකුල් පොහොර යෙදීම

## සිටුවා මාස තුනේ දී හා හතරේ දී

- ඉහත ආකාරයටම කාණු සකස් කර කුකුල් පොහොර යොදා කාණුවට පිටතින් කවාකාර ගැට්ට සකස් කරන්න.
- වටපණු නාශකය වෙනුවට ට්‍රයිකොඩෝමා දිලීරය අඩංගු කාබනික පොහොර කිලෝග්‍රෑම් 15 ක් පමණ ගස මුලට විසුරුවා හරින්න.

## වගාවට මාස හයක් ගතවූ පසු

- නැවත ශාකවල වටපණු හානියේ මූලික ලක්ෂණ පෙන්නුම් කරයි නම් ශාකයේ මූල මණ්ඩල කලාපයට වටපණු නාශකයකින් ප්‍රතිකාර කරන්න.
- මෙහිදී මසකට වරක් ලෙස අවස්ථා දෙකක දී පමණක් වටපණු නාශකය භාවිතා කළ යුතුය.
- අවශ්‍ය නම් නැවත යෙදීම කළ යුත්තේ අවම වශයෙන් අවසන් යෙදීමෙන් මාස හයකට පසුය.



නව වගාවක් ස්ථාපිත ක්ෂේත්‍රයක්

**ඉහත ක්‍රම වඩාත් සාර්ථකව හා නිවැරදිව සිදු කිරීම මගින් පේර වගාවේ වටපණු හානිය අවම කර ගත හැකිය.**

**පේර වගාවේ වටපණු හානිය පාලනය කිරීමේ කාර්යසාධන බලකාය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**


තාක්ෂණික තොරතුරු :
කේ.එම්.ඩී.ඩබ්. ප්‍රභාත් නිශාන්ත (පර්යේෂණ නිලධාරී)
ඞී.එස්. පුෂ්පකුමාරි (පර්යේෂණ නිලධාරී)

තාක්ෂණික සහාය :
එච්.ඒ.එල්. හර්ෂානි කුමාරි පෙරේරා (පර්යේෂණ සහකාර)
එම්.පී.එන්.ටී. මහගොල්ලගේ (පර්යේෂණ සහකාර)
ආර්.එම්. මේනකා සුජානි රණතුංග (තාක්ෂණ සහකාර)

සැකසුම
ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය, ගන්නොරුව, පේරාදෙණිය

මුද්‍රණය
කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව




**පේර** වගාවේ මූල ගැටිති වටපණු පාලනය - 02

# නව වගාවක් ස්ථාපනයට උපදෙස්




**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි - 2015**

වටපණු හානිය පාලනයේ දී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණ වන්නේ වටපණුවන් ශාකයට ඇතුල්වීමට පෙර සිටම පාලන ක්‍රම අනුගමනය කිරීමයි. ඒ සඳහා ඒකාබද්ධ පාලන ක්‍රමවේදයන් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එබැවින් මෙම හානිය අවම කර ගැනීම සඳහා පහත ක්‍රමවේදය අනුගමනය කළ හැක.

## නව වගාවක් ස්ථාපනයේ දී

- අඩි 2 x 2 x 2 ප්‍රමාණයේ වලක් කපා එයට කුකුල් පොහොර කිලෝ ග්‍රෑම් 25-30 ක් මතුපිට පස් සමග මිශ්‍ර කර වල පුරවන්න.
- පසුව කුකුල් පොහොර යොදා සකස් කරන ලද වලට අඛණ්ඩව දින 5 ක් ජල සම්පාදනය කරන්න.
- සති දෙකකට පමණ පසු කුකුල් පොහොර යොදා සකස් කර ගන්නා ලද වලෙහි පස බුරුල් කර නැවත කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 10 ක් පමණ යොදා නිරෝගී පැළ සිටුවන්න.



පැළ සිටුවීමට සකස් කරන ලද වලක්



කොම්පෝස්ට් මිශ්‍රකර පැළ සිටුවීම සඳහා සූදානම් කර ඇති වලක්

- පැළය සිටවූ විගස පැළයේ මුල අවට ප්‍රදේශය හොඳින් තෙමී යන පරිදි වටපණු නාශකයක් යොදන්න.



වටපණු නාශකයකින් පාංශු ප්‍රතිකාර කිරීම

## පැළය සිටුවා මාසයකට පසු

- පැළයට අඩි දෙකක් පමණ දුරින් මුල් වලට හානි නොවන පරිදි පැළය වටා කවාකාරව කාණුවක් සකස් කරන්න.
- එයට කුකුල් පොහොර කිලෝග්‍රෑම් 20-30ක් පමණ යොදා නැවත හොඳින් පස් සමග මිශ්‍ර කරන්න.
- මෙම කාණුවට පිටතින් බේසමක් ආකාරයට කවාකාර ගැට්ටක් සකස් කර මුල මණ්ඩල ප්‍රදේශයට වටපණු නාශකයක් යොදන්න.





කාණුවට පිටතින් බේසමක් ආකාරයට කවාකාර ගැට්ටක් සකස් කිරීම

## පැළය සිටුවා මාස දෙකකට පසු

- ශාකයට අඩි තුනක් පමණ දුරින් මුල්වලට හානි නොවන පරිදි ශාකය වටා කවාකාරව කාණුවක් සකස් කරන්න.
- එයට කුකුල් පොහොර කිලෝග්‍රෑම් 20-30ක් පමණ යොදා හොඳින් පස් සමග මිශ්‍ර කරන්න.
- මෙම කාණුවට පිටතින් බේසමක් ආකාරයට කවාකාර ගැට්ටක් සකස් කර මුල මණ්ඩල ප්‍රදේශයට වටපණු නාශකයක් යොදන්න.